බලා වෛද්‍යවරුන්ට ප්‍රවාහන ගාස්තු ගෙවීම පිළිබඳ වැඩපිළිවෙළක් සෞඛ්‍ය. මහාමාර්ග සහ සමාජ සේවා අමාත්‍යාංශය විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර සකස් කළ යුතුය.

3 : 3 1991 මැයි මස 17 දිනැති අංක 662/11 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද සෞඛ්‍ය සේවාවේ වෛද්‍ය නිලධාරීන් සම්බන්ධ සේවා ව්‍යවස්ථාව යටතේ තනතුරු දරන වෛද්‍ය නිලධාරීන්ගේ වේතනයේ කොටසක් වන විශ්‍රාම වැටුප් සහිත සහ විශ්‍රාම වැටුප් රහිත දීමනා දිගටම ගෙවනු ලැබේ. මේ අනුව පහත සඳහන් දීමනා ලබා ගැනීමට එම වෛද්‍ය නිලධාරීන්ට හිමිකම් ඇත.

| ශ්‍රේණිය | විශ්‍රාම වැටුපට ගණන් ගැනෙන දීමනා රුපියල් | විශ්‍රාම වැටුපට ගණන් නොගැනෙන දීමනා රුපියල් |
|---|---|---|
| ප්‍රාථමික | 1700.00 | 2,125.00 |
| II වන ශ්‍රේණිය | 1700.00 | 1,700.00 |
| I වන ශ්‍රේණිය | 3400.00 | |
| විශේෂඥ | 3400.00 | |
| වෛද්‍ය පරිපාලන | 3400.00 | |

3 : 4 රාජ්‍ය අංශයේ ගෙවනු ලබන අතිකුත් දීමනා සහ දිරි දීමනා ආදිය පිළිබඳව නැවත සලකා බැලීම පිණිස කමිටුවක් පත් කිරීමට රජය තීරණය කර ඇත. උක්ත කමිටුව මගින් එම දීමනා සලකා බැලෙන තෙක් එම දීමනා දැනට ගෙවන මට්ටමේ පවත්වා ගෙන යා යුතුය.

4. අංක I, II සහ III දරණ පරිශිෂ්ට වලින් ආවරණය නොවන වැටුප් පරිමාණ ඇත්නම් ඒ ගැන පැහැදිලි කිරීම් ආයතන අධ්‍යක්ෂ ජනාරාල් වරයාගෙන් ලබා ගත යුතුය.

5. වැටුප් වර්ධක

5 : 1 වැටුප් වර්ධක දින නොවෙනස්ව පවතී.

5 : 2 දැනට පවතින වැටුප් පරිමාණ අනුව 1996.12.31 දිනට හෝ ඊට පෙර උපයා ගෙන ඇති වැටුප් වර්ධක 1997 නව වැටුප් වලට පරිවර්තනය කිරීමට පෙර ලබා දිය යුතුය.

5 : 3 1997.01.01 දින හෝ ඊට පසු උපයා ගන්නා වැටුප් වර්ධක වෙනුවෙන් 1997 නව වැටුප් වලට අදාල වර්ධකයේ සම්පූර්ණ වටිනාකම ප්‍රදානය කළ යුතුය.

6. රැඳී සිටීමේ වාසි

6 : 1 වැටුප් පරිමාණයේ උපරිමයේ රැඳී සිටින පැම අවුරුදු දෙකක් වෙනුවෙන්ම "රැඳී සිටීමේ වාසි" ලැබීමට 1997.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිලධාරියකුට හිමිකම් ඇත. ඊළඟ ඉහළ ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ උපරිමයට වැඩි නොවන පරිදි හෝ වර්ධක පහකට වැඩි නොවන පරිදි හෝ යන මේ දෙකින් වඩා අඩු ප්‍රමාණයකට පමණක් "රැඳී සිටීමේ වාසිය" සීමා වේ. තනතුරට හිමි වැටුප් පරිමාණයේ අවසාන වශයෙන් ලැබූ වැටුප් වර්ධකයේ අගය "රැඳී සිටීමේ වාසිය" ගණනය කිරීම සඳහා යොදා ගත යුතු අතර ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 10 : 1 ඡේදය ද අදල කර ගත යුතුය.